# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2029/6 - 2017 ජූලි මස 24 වැනි සඳුදා - 2017.07.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත සහ 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් සංශෝධනය කර ඇති 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත

**බලය පැවරීම**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත සමග කියවෙන 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් සංශෝධනය කර ඇති 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2(4) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව නැගෙනහිර පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන සංවර්ධන, ධීවර, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීමේ හා බෙදාහැරීමේ අමාත්‍ය ක්‍රිෂ්ණ පිල්ලෙයි තුරෙයිරාජසිංහම් වන මම, නැගෙනහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහාය වීමට පත්කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ I වැනි තීරුවේ නම් සඳහන් එක් එක් අය වෙත 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් සංශෝධනය කර ඇති 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ හා එම පනත යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියළුම බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් දින සිට ක්‍රියාත්මක කරනු පිණිස මෙයින් පවරමි.

ක්‍රිෂ්ණ පිල්ලෙයි තුරෙයිරාජසිංහම්,
කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන සංවර්ධන,
ධීවර, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීමේ හා බෙදාහැරීමේ අමාත්‍ය,
නැගෙනහිර පළාත.

ත්‍රිකුණාමලය.


1A - PG 3622 — 08 (2017/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| 1. රාජනි ගනේෂපිල්ලේයි | 2017.07.01 | සමුපකාර සමිති පනතේ 3, 4, 4(2) හැර 5, 6, 7, 8, 33, 39, 42, 43, 44, 44(6), හැර 45, 46, 50, 52, 53, 54, 58, 58(2) අ සහ 58(5) හැර 59, 68 සහ 72 වැනි වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියළු බලතල සහ සමුපකාර රීති මාලාවේ 4, 11, 15, 16(11), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49, 49(xii) හැර 52 සහ 53 දරන රීතිය යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියළු බලතල. |
| 2. කනහසභයෙ කනහසුන්දරම් | 2017.07.01 | |
| 3. කළුතර ආරච්චිගේ නලීන්මහී කුමාර් | 2017.07.01 | |
| 4. මොහොමඩ් මුස්තප්ෆා ජුනයිදීන් | 2017.07.01 | |
| 5. කනගරත්නම් වෙල්වෙන්ද්‍රම් | 2017.07.01 | |

08 - 251

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.